www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# විදුලි බල කම්කරුවෝ වැටුප් වැඩිවීම ඉල්ලති

## Sri Lankan power workers demand higher wages

ඩබ්ලිව්. ඒ. සුනිල් විසිනි

2009 ජුලි 23

වැටුප් වැඩිවීමක් සහ පෙර පැවති සේවා කොන්දේසි යලි තහවුරු කරන ලෙස ඉල්ලා ලංකා විදුලි බල මන්ඩලයේ (ලංවිම) කම්කරුවෝ දහස් ගනනක් ජුලි 27 ජාතික පරිමාන විරෝධතා උද්ඝෝෂනයක යෙදුනහ. ලංවිම 14,000ක බලගතු ශ්‍රම බලකායෙන් වැඩි පිරිසක් කාර්මික ක්‍රියාවට සම්බන්ධ වීම ආන්ඩුව විසින් ජීවන කොන්දේසිවලට එල්ල කරන ප්‍රහාරවලට එරෙහිව වැඩෙන විරුද්ධත්වය පෙන්නුම් කිරීමකි.



කොලඹ විදුලිබල කම්කරුවන්ගේ උද්ඝෝෂනය

පොලීසියේ බියගැන්වීම් නොතකා දහසකට ආසන්න විදුලිබල කම්කරුවෝ පිටකොටුවේ දුම්රිය පොල ඉදිරිපිට පිකට් උද්ඝෝෂනයක නිරත වූහ. ලංවිම ප්‍රධාන කාර්යාලය ඉදිරිපිට පිකට් කිරීම වැලැක්වීම සඳහා බලධාරීහු කොමාන්ඩෝ භටයන් ඇතුලු සන්නද්ධ පොලීසිය යෙදවූහ.

ජාතික විරෝධතා උද්ඝෝෂනය කැඳවනු ලැබුවේ ජනතා විමුක්ති පෙරමුනට (ජවිපෙ) සම්බන්ධ ලංකා විදුලිබල සේවක සංගමය (ලංවිසේස) මූලිකත්වය දරන ලංවිම වෘත්තීය සමිති කිහිපයක සන්ධානයක් වන ලංවිම එක්සත් වෘත්තීය සමිති පෙරමුන (එවෘසපෙ) විසින් ය.

තවත් වෘත්තීය සමිති හවුලක් වන ලංවිම වෘත්තීය සමිති එකතුව (වෘසඑ) වැටුප් වැඩි කිරීම් අත් හිටුවීමේ ආන්ඩුවේ තීන්දුවට යටත් වෙමින් උද්ඝෝෂනයට සම්බන්ධ වීමෙන් වැලකී සිටියේ ය. ආන්ඩු-ගැති ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය සහ නව සමසමාජ පක්ෂයට සම්බන්ධ බිල් නිලධාරින්ගේ සංගමය, පාලන මැදිරි සේවක සංගමය සහ ලංවිම ඉංජිනේරු සංගමය මෙම පෙරමුනට සම්බන්ධ ප්‍රධාන වෘත්තීය සමිති ය.

ලංවිම කම්කරුවන්ගේ ඉල්ලීම්වලට සියයට හතලිහක වැටුප් වැඩි වීමක්, අතිකාල පය ගනන, පෙර පැවති විශ්‍රාමික වයස සහ යැපෙන්නනන් සඳහා වූ වෛද්‍ය පහසුකම් යලි තහවුරු කිරීම ඇතුලත් වෙයි. ලංවිම කම්කරුවන්ට අවසන් වරට වැටුප් වැඩිවීමක් ලැබුනේ 2006 වසරේදී ය. ඊලඟ නිල වැටුප් වැඩි වීම 2009 ජනවාරි මාසයට නියමිත වුවත් එය තවමත් ලැබී නැත. පසුගිය වසරේ ශ්‍රී ලංකාවේ උද්ධමනය සියයට තිහකි. එය ආසියාවේ ඉහල ම උද්ධමන ප්‍රතිශතයයි.

වියදම් කප්පාදු කිරීමේ ප්‍රයත්නයේ කොටසක් ලෙස ලංවිම පාලනාධිකාරය අතිකාල පැය ගනන කප්පාදු කර විශ්‍රාමික වයස් පරිමාව වයස 60 සිට 57 දක්වා අඩු කලේය. වෛද්‍ය ශල්‍යකර්ම සඳහා ගෙවනු ලබන මුදල රුපියල් 800,000 සිට 900,000 දක්වා ඉහල දමා ඇති නමුත් සේවකයන් ගෙන් යැපෙන්නන් සඳහා එම පහසුකම අත්හිටුවා ඇත.

ලංවිම කම්කරුවන්ගේ ඉල්ලීම් තීරනාත්මක දේශපාන ප්‍රශ්න මතු කරන නමුත් එවෘසපෙ උද්ඝෝෂනය අක්‍රිය ලෙඩ නිවාඩු දැමීමකට සීමා කරමින් ආන්ඩුවට බලපෑම් දැමීම මගින් ඉල්ලීම් දිනාගත හැකි බවට මිථ්‍යාවන් වපුරයි.

යුද ව්‍යායාමය සඳහා පරිපරිත්‍යාග කල යුතු යැයි කියා සිටිමින් කම්කරුවන්ගේ සියලු ඉල්ලීම් යටපත් කිරීම සඳහා මහින්ද රාජපක්ෂ ආන්ඩුව බෙදුම්වාදී දෙමල විමුක්ති කොටි සංවිධානය ට (එල්ටීටීඊ) එරෙහි යුද්ධය උපයෝගි කර ගත්තේ ය.

මැයි මාසයේ මිලිටරි ජයග්‍රහනයෙන් පසු ආන්ඩුව ගැඹුරුවන ආර්ථික අර්බුදයේ බර දිගටම වැඩ කරන ජනතාව මතට පටවමින් සියලු ම විරුද්ධත්වයන් මර්දනය කරනු ලබයි. ලංවිම කම්කරුවන්ගේ වැටුප් සහ සේවා කොන්දේසි සම්බන්ධ ඉල්ලීම්වලට එරෙහි ප්‍රහාරය රාජ්‍ය අංශයේ සියලුම සේවකයන්ගේ අයිතීන්වලට එල්ල කෙරුනු පලල් ප්‍රහාරයක කොටසකි.

ඉහල ආරක්ෂක වියදම් සහ ශ්‍රී ලංකාව මත ගෝලීය මූල්‍ය අර්බුදයේ බලපෑම හුවාදක්වමින් රාජපක්ෂ මාර්තු මාසය මුලදී සියලු ම රාජ්‍ය සේවකයන් සඳහා වැටුප් වැඩිවීම් අත්හිටවූයේ ය. ආර්ථික අර්බුදය ජය ගැනීම සඳහා "ආර්ථික යුද්ධයක්" ආරම්භ කරන බව ඉන් මාස දෙකකට පසුව ප්‍රකාශ කල රාජපක්ෂ "ජාතිය ගොඩනැගීම" සඳහා පරිත්‍යාග කරන ලෙස කම්කරුවන්ගෙන් ඉල්ලා සිටියේ ය. මධ්‍යම කඳුකරයේ මොනරාගල පැවති ඌව පලාත් පාලන මැතිවරන රැස්වීමක දී මෙම ඉල්ලීම් යලි මතු කලේ ය. ශ්‍රී ලංකා සොල්දාදුවන් "මව්බිම ආරක්ෂා කලා" ආකාරයට කම්කරුවන් වෙහෙස වී වැඩ කල යුතු යයි රාජපක්ෂ රැස්වීමේ දී ඉල්ලා සිටියේ ය. සොල්දාදුවන් "කෑම පැයක් ඉල්ලන්" නැතිව "නිදිවර්ජිතව" සිටීමට සූදානම්ව සිටි බව රාජපක්ෂ ප්‍රකාශ කලේ ය.

එම නිසා ලංවිම කම්කරුවන්ගේ ඉල්ලීම් ආන්ඩුව සමග සෘජු ගැටුමකට ඔවුන්ව තල්ලු කරනු ලබයි. ආන්ඩුව ලංවිම කම්කරුවන්ගේ ඉල්ලීම්වලට අවනත නොවන බව විදුලිබල සහ බලශක්ති අමාත්‍යංශයේ ලේකම් එම්සීඑම් ෆර්ඩිනැන්ඩු පසුගිය සිකුරාදා (17) උද්ඝෝෂනය අද්දර දී පැහැදිලිව සඳහන් කලේ ය. ජනාධිපති රාජපක්ෂගේ "අනුමැතියකින් තොරව" සේවකයන්ගේ ඉල්ලීම් පිලිබඳව ලංවිම පාලනාධිකාරයට කිසිදු තීන්දුවක් ගත නොහැකි බව ද ඔහු ප්‍රකාශ කලේ ය.

## විදුලිබල පුද්ගලීකරනය

යුද්ධයේ උග්‍රතම අවස්ථාවේ දී රාජපක්ෂ ආන්ඩුව රජයට අයිති විදුලිබල කර්මාන්තය පුද්ගලික අංශයට ඩැහැගැනීමට මග පාදන විදුලිබල මන්ඩල පනත සම්මත කලේ ය. ආන්ඩුවේ පුද්ගලීකරනයට සහ රාජ්‍ය අංශයේ වැටුප් කැපි කිරීමට වෘත්තීය සමිති පෙරමුනු දෙකේම ප්‍රතිචාරය වී ඇත්තේ කම්කරුවන් බෙදීමසහ කම්කරුවන් අතර පවතින විරුද්ධත්වය වාෂ්ප කිරීම අරමුනු කරගත් ආන්ඩුවට පීඩාකාරී නොවන විරෝධතා උද්ඝෝෂනවලට කම්කරුවන්ගේ අරගලය සීමා කිරීමය.

පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට අදහස් කර නැතැයි ආන්ඩුව බොරු කී විට නියමිතව තිබූ උද්ඝෝෂනය අත්හිටුවමින් වෘත්තීය සමිති පෙරමුනු දෙකම විදුලි බල පනතට එරෙහි අරගලය නතර කලහ.

මාර්තු මාසයේ දී පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කල විට ජවිපෙ මූලිකත්වයෙන් යුතු සමිති පෙරමුන එක්දින විරෝධතා උද්ඝෝෂනයක් පැවැත් වූ අතර ඉන් එහා වෘත්තීය සමිති ක්‍රියාවන්ට යාමට විරුද්ධ විය. කම්කරුවන්ගේ ඉල්ලීම්වලට වඩා යුද්ධයට ප්‍රමුඛත්වය දිය යුතු යයි ප්‍රකාශ කරමින් සිංහල ස්වෝත්තමවාදී ජවිපෙ මුලුමනින් ම යුද්ධයට සහාය දුන්නේ ය. ජවිපෙ වෘත්තීය සමිති නායකයන් වන ජයලාල් සහ කේඩී ලාල්කාන්ත පනතට විරුද්ධ බව ප්‍රකාශ කලත් ඊට එරෙහි අරගලයකට ඔවුහු විරුද්ධ වූහ.

ආන්ඩුව ලංවිම සේවකයන්ගේ වැටුප් හා සේවා කොන්දේසි පිලිබඳ ඉල්ලීම් දීමට අසමත් වුනොත් "අප දැඩි වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයකට යන" බව පසුගිය සතියේ කොටුව දුම්රිය පොල ඉදිරිපිට දී ජේවීපී වෘත්තීය සමිති නායක රන්ජන් ජයලාල් ප්‍රකාශ කලේ ය. එහෙත් මේ සතියේ මාධ්‍ය සාකච්ඡාවක් කැඳවා "ඊනියා දැඩි වෘත්තීය සමිති ක්‍රියාමාර්ගය" අගෝස්තු 28 පැවැත්වෙන තවත් විරෝධතා උද්ඝෝෂනයක් බව නිවේදනය කලේ ය.

මෙම මවාපෑම් හුදෙක්ම රාජපක්ෂ ආන්ඩුවට එහි යුද්ධයට, සහ එහි අයවැය ලේඛනයට ජවිපෙ සහයෝගය සැඟවීමට සැලසුම් කල ඒවා ය. ආන්ඩුව එය පිලිගත්තොත් තමන් ආන්ඩුවට එකතු වන බව ඇඟවුම් කරමින් ජවිපෙ පසුගිය මාසයේ "ජාතිය ගොඩනැගීමේ" තමන්ගේ ම වැඩ පිලිවෙලක් ඉදිරිපත් කලේ ය.

ලංවිම අනෙක් වෘත්තීය සමිති සංධානය වන වෘත්තීය සමිති එකතුව ද ඒ හා විනාශකාරී පිලිවෙතක් අනුගමනය කරයි. *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* වෘත්තීය සමිති එකතුවේ කැඳවුම්කරු ආනන්ද නිමලරත්න ඇමතුවිට ඔහු ප්‍රකාශ කලේ "වැටුප් ඉල්ලීම් සාධාරන නමුත් මූල්‍ය ප්‍රශ්න නිසා මේ අවුරුද්දේ වැටුප් වැඩි කරන්න බැහැ කියලා ආන්ඩුව කියලා තියෙනවා. එම නිසා පවතින තත්ත්වය තුල ආන්ඩුවට බලපෑම් නොකල යුතුයයි. අප තීන්දු කරලා තියෙනවා".

නිමලරත්න සමග සන්ධානගතව සිටින, නසසප සමිති නායක ප්‍රියන්ත වික්‍රමසිංහ ද *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* විසින් දුරකතනයෙන් සම්බන්ධ කර ගත්තේ ය. වැටුප් කැපි කිරීමට ඔහුගේ සමිතියේ සහයෝගය වහංගු කිරීමට උත්සාහ කරමින් ඔහු මෙසේ ප්‍රකාශ කලේ ය. "ඔවුන් අපට ආරාධනය නොකල නිසා මැත අරගලයට අප සම්බන්ධ වුනේ නැහැ. අප්‍රේල් මාසේ අප කැඳවුම් කල වර්ජනයට ඔවුන් සම්බන්ධ වුනේ නැහැ. උද්ඝෝෂනයක් සංවිධානය කිරීමට අප සාකච්ඡා කරමින් ඉන්නවා නමුත් තවම තීන්දු කරලා නැහැ කවද්ද කරන්නේ කියලා".

පහුගිය එක්සත් ජාතික පක්ෂ ආන්ඩුවට ඉදිරිපත් කල පනතට වඩා මේ ආන්ඩුවේ පනත "ප්‍රගතිශීලී" බව ප්‍රකාශ කරමින් වික්‍රමසිංහ සහ නසසප නායක වික්‍රමබාහු කරුනාරත්න පනතට සහයෝගය දුන්හ. කෙසේ නමුත් පනත් දෙක අතර ඇත්තේ සුලු වෙනසකි. විදුලිබල උත්පාදනය සහ බෙදා හැරීම ඔක්තෝබර් මාසයේ දී පුද්ගලික සමාගම් 200 විකිනීමට රාජපක්ෂ ආන්ඩුව සැලසුම් කරයි.

ලංවිම කම්කරුවන්ට තමන්ගේ අරගලය පෙරට ගෙන යාමට හැකිවන්නේ ප්‍රහාරයට ගොදුරුව සිටින සියලුම කම්කරු කොටස් - රාජ්‍ය සහ පුද්ගලික අංශයේ - ඒකාබද්ධ කරගත් අරගලයක් තුල පමනි. මෙය පවත්නා වෘත්තීය සමිති රාමුවෙන් දේශපාලනිකව බිඳීමක් සහ සමාජවාදී ඉදිරිදර්ශනයක් සඳහා ස්වාධීන දේශපාලන අරගලයක් ඉල්ලා සිටියි.

රාජපක්ෂ ආන්ඩුවේ "ආරථික යුද්ධය" සහ ගෝලීය මූල්‍ය අර්බුදය හේතු කොට ගෙන පුද්ගලික අංශයේ රැකියවා දස දහස් ගනනක් විනාශ වී ඇත.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ගැනීමට බලාපොරොත්තු වන නය මුදල සමග බැඳී ඇති කොන්දේසි මගින් රාජ්‍ය ආදායම් ඉහල දමා ගැනීම සඳහා රාජ්‍ය අංශයේ දැවැන්ත ප්‍රතිව්‍යුහගත කිරීමක් සහ ජීවන කොන්දේසි මත ගැඹුරුවන ප්‍රහාරයක් එල්ල කෙරෙනු ඇත.

වැඩ කරන ජනතාවට මෙම ප්‍රහාරවලට විරුද්ධව සටන් කල හැකි වන්නේ දකුනු ආසියාවේ සහ ජාත්‍යන්තර සමාජවාදී අරගලයේ කොටසක් ලෙස කම්කරු-ගොවි ආන්ඩුවක් - ශ්‍රී ලංකා-ඊලම් සමාජවාදී සමූහාන්ඩුවක් - සඳහා සටන් කිරීම මගින් පමනි.

© www.wsws.org